## කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

### පූර්ණ රජය සතු සමාගමකි

## වා ර් ෂි ක  වා ර් තා ව

## 2 0 1 6 / 2 0 1 7


**ප්‍රධාන කාර්යාලය**
561/3,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

| | | |
|---|---|---|
| දුරකතන | : | 011 - 2368738 |
| ෆැක්ස් | : | 011 - 2058062 |
| විද්‍යුත් තැපැල | : | kgll@sltnet.lk |
| වෙබ්අඩවිය | : | www.kgraphite.lk |

**පතල් කාර්යාලය**
කහටගහ පතල
මදුරාගොඩ,
දොඩන්ගස්ලන්ද.

| | |
|---|---|
| දුරකතන | : 037-2252015 |
| ෆැක්ස් | : 037-4931711 |

# අන්තර්ගතය


| | |
|---|---|
| හැඳින්වීම | 01 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 02 |
| විගණන කමිටු වාර්තාව | 04 |
| ආයතනික දැක්ම, මෙහෙවර හා අරමුණු | 05 |
| සංවිධාන ව්‍යුහය | 06 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 07 |
| විශේෂ ගිණුම්කරණ තොරතුරු | 12 |
| වාර්ෂික ගිණුම් | 13 |
| රැස්වීම පිළිබඳ දැන්වීම | 14 |
| පෙරකලාසි ආකෘති පත්‍රය | 15 |

# හැඳින්වීම

# කහටගහ මිනිරන් වැඩබිම

''කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්'' සමාගම මගින් කළමනාකරණය කරනු ලබන කහටගහ පතල පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොළඹ අගනුවර සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 90ක් පමණ දුරින් වූ මදුරාගොඩ, දොඩන්ගස්ලන්ද ප්‍රදේශයෙහිය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන සම්පූර්ණයෙන් රජය සතු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලද එහි ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාය. විධායක සභාපතිවරයා ප්‍රධානකොට ගත් අධ්‍යක්ෂ මණ්ඩලය, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයා වන අතර ආයතනික ප්‍රතිපත්තිවල භරය උකහාගන්නේ එහි රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයෙනි.

රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මදුරාගොඩ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ පිහිටි කහටගහ පතල මුහුදු මට්ටමේ සිට මීටර් 25ක් උසින් කඳුකර පෙදෙසක, ආසන්න වශයෙන් අක්කර 102ක භූමි භාගයක පිහිටා තිබෙන අතර එම අක්කර 102න් අක්කර 76ක වූ පොල් වගාවද 'කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්' සමාගම මගින් කළමනාකරණය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ, බෝගල පතල සහ කහටගහ පතල යනුවෙන් නම්කර ඇති ප්‍රධාන පතල් දෙකකි. 1872 සිට මෙහෙයුම් කටයුතු සිදු කෙරුණු කහටගහ පතල, කහටගහ සහ කොලොන්ගහ යන පතල් දෙකෙහි එකතුවකි. 1973 වර්ෂයේ රජය යටතට ගත් පසුව මෙම පතල් දෙක එකතුකොට එක් පතලක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

පතල් ආවාට දෙකක් මගින් ප්‍රවේශ විය හැකි අඩි 2000 (මීටර් 610) ක ගැඹුරකින් යුක්ත කහටගහ පතල වූ කලී ශ්‍රී ලංකාවේ ගැඹුරුතම පතලයි. කහටගහ පතල් ආවාටය අඩි 1132 ( මීටර් 345 ) ක් වන අතර කොලොන්ගහ අඩි 330 (මීටර් 101 ) මට්ටම දක්වා ගමන් කරයි. මෙම ආවාට වෙන වෙනම ස්ථාන දෙකකින් මිහිතුල දක්වා කැණීම් කර ඇත. පහළ ඇති පතල් ආවාටයේ ප්‍රවේශය වන්නේ අඩි 2000 (මීටර් 610 ) ක් දක්වා වූ වින්ච් (winch) මාලාවයි. ප්‍රධාන විංචිය සහ අනෙකුත් විංචි මිහිතුල කම්කරුවන් අඩි 1132 සිට අඩි 2000 මට්ටම දක්වා විවිධ මට්ටම් වලට ගෙන යාමට යොදාගනු ලබයි. පතල, එහි පුළුල්ම ස්ථානයේදී මීටර් 500ක් තරම් දක්වා වූ දුරකට ව්‍යාප්ත වේ.

### කහටගහ නිෂ්පාදනයන්හි අනන්‍ය බව

ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් සපයන අනන්‍ය සැපයුම්කරු ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම, කහටගහ පතල 99%ට වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත සම්පූර්ණයෙන් ස්ඵටික බවට පත්වූ ස්වරූපයෙන් පවතින ඉහළ පිරිසිදුභාවයකින් යුත් ස්වභාවික ඉල්ලම් මිනිරන් කැණීමේ හැකියාවක් සහිතය. එය ඉදිකටු වැනි සිහින් තුඩැති කූරු, කුට්ටි සහ පතුරු වශයෙන් දැකගත හැකි අතර අඩු භාෂ්මිතිකතාවක් සහිත ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත් ස්ඵටික ඉල්ලම් මිනිරන් වශයෙන් බහුලව පවතී. තවද, ලොව පිළිගත් අනන්‍ය නිෂ්පාදනයක් වශයෙන් ලෝක වෙළඳපොළෙහි කීර්තිනාමයක් තහවුරු කරගෙන තිබේ.

# ස භා ප ති තු මා ගේ  ස මා ලෝ ච න ය

මම කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්හි සභාපති වශයෙන් 2016/2017 වර්ෂයේ වාර්ෂික ගිණුම් පිළිබඳ මාගේ සමාලෝචනය මෙයින්ඉදිරිපත් කරමි. සමාලෝචිත වර්ෂයේ මෙම කාලසීමාව තුල ආයතනයේ කාර්යසාධනය සලකා බැලීමේදී සැලකිය යුතු ඵලදාකත්වයක් ලබාගෙන ඇත.

## නිෂ්පාදනය

2016/17 සමාලෝචිත වර්ෂය තුල කණින ලද මිනිරන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 811 කි. මෙය පෙර වර්ෂයේ නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 771 හා සසඳන කල 5.1 ක ප්‍රතිශතයකින් වැඩි වීමකි. නව ගනුදෙනුකරුවන් වෙතින් අපේක්ෂිත මිනිරන් ඇනවුම් සැපයීම සඳහා නිෂ්පාදනය ඉහල නැංවීමේ අරමුණින් ආයතනය විසින් නිෂ්පාදනය පදනම් කරගත් දීමනා ක්‍රමයක් ක්‍රියාවට නංවන ලදි. එබැවින් සේවකයන්ඉහල ඉලක්ක වෙත ලඟාවීමේ අරමුණින් යුතුව දැඩි කැපවීමෙන් නිෂ්පාදන කාර්යයේ නිරත වේ.

## විකුණුම් සහ අලෙවිකරණය

මෙම වර්ෂයේදී අපනයනය සඳහා සැකසූ මිනිරන් මෙට්‍රික් ටොන් 530 ක් රුපියල් මිලියන 112 ක මිලකට අපනයනය කර ඇති අතර පෙර වර්ෂයේ රුපියල් මිලියන 109 ක ආදායම හා සසඳන කල එයින් සමාගමේ ආදායම රුපියල් මිලියන 3.4 කින් ඉහලගොස් තිබේ. මෙසේ ආදායම ඉහල යාමට හේතු වූයේ විශේෂයෙන් ඉහල තත්වයකින් යුත් 97/99% C ශ්‍රේණියේ සකසන ලද මිනිරන් සඳහා ඔස්ට්‍රේලියානු ගැනුම්කරුවකුගෙන් ලද නව ඇණවුම් හේතුවෙනි.

## මූල්‍ය තත්වය

සුපපුරුදු පරිදි අපගේ බොහොමයක් පිරිවැය සංරචක ස්වභාවිකව තීරණය වී ඇති අතර, ලාභය ඉහල නැංවීමේ අරමුණින් වියදම් පාලනය කිරීම සඳහා කළමනාකරණය උපරිම ප්‍රයත්නයක් දැරීය. නිෂ්පාදන මත දිරිදීමනා ක්‍රමය ක්‍රියාවට නංවන ලෙස කළමනාකරණයට බලකරමින් මිහිතුල සේවකයන් විසින් පෙර දැනුවත්කිරීමකින් තොරව සිදුකල නිලනොලත් සේවක විරෝධය හේතුවෙන් මෙම වසර තුල සේවක පිරිවැටුම ඉහල ගියේය. මෙම විරෝධය මිහිතුල අඩි 2000 මට්ටම තුල සිදුකල බැවින් සේවකයන්ගේ ජීවිත වලට වගකීමට කළමනාකරණයට සිදුවීම නිසා කළමනාකරණය මහත් පහසුතාවයකට පත්විය. එම තත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙන් හදිසි එකඟතාවයකට එළඹීමට කළමනාකරණයට සිදුවිය. කෙසේවෙතත් මෙම සාමුහික එකඟතාවය ආයතනයට වඩාත් ඵලදායී ලෙස සංශෝධනය කිරීමට කළමනාකරණය සලකා බලමින් සිටී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වන එස්.එල්.එෆ්.ආර්.එස්. මගින් එස්.එම්.ඊ. සඳහා නියම කරන ලද ක්ෂය කිරීම් වෙනුවෙන් වෙන්කල රු. මිලියන 4.4 ද ඇතුලත්ව බදුපෙර ආයතනික ලාභය මෙම වසර සඳහා රු. මිලියන 2.52 ක් විය.

## මිහිතුල සංවර්ධනය

අවම මූල්‍ය තත්වයක් තුල වුවද මෙහෙයුම් කටයුතු නොනවත්වා සිදුකල අතර රු. මිලියන 4.4 ක් වැයකරමින් මිහිතුල සංවර්ධන කටයුතු වලට අවශ්‍ය පිරියත හා උපකරණ සපයනු ලැබීය. එමෙන්ම නව කේබල් සහ නිසි ආරක්ෂණ උපකරණ සපයමින් මිහිතුල විංච් පද්ධතිය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කරන ලදි.

## ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු

දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා නොකිරීම හා හානිවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් සමහර ගොඩනැගිලි ජරාවාස වී භාවිතා කිරීමට නොහැකි තත්වයකට පත්ව තිබුනි. විශේෂයෙන් සභාපතිතුමාගේ බංගලාව හා බංගලා භාරකරුගේ නිවස සම්පූර්ණයෙන්ම ජරාවාස වී කැලෑවට ඉඩහැර තිබුනි. එබැවින් සමාලෝචිත වර්ෂය තුලදී බංගලාව හා නිවස සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කල අතර පස් කඩාවැටීම හේතුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ හානි වී තිබූ සභාපතිතුමාගේ බංගලාවේ ආරක්ෂිත තාප්පය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කරන ලදි.

කෙසේ නමුත් අක්කර 102 ක් වූ පතල් භූමි භාගයෙන් අක්කර 50 ක පමණ ප්‍රමාණයක් සඳහා තවමත් තීන්දු නොවූ උසාවි නඩු කටයුතු පවතින අතර කිසිදු පාර්ශවයකට භාවිතා කිරීමට නියෝගයක් නොදීම නිසා වල් බිහිවී, දැනට ගම්වැසියන් විසින් භාවිතා කරනු ලැබේ. ඇතැම් පෙර සිටි සේවකයින් තවමත් එහි නිල නිවාස බලෙන් අත්පත් කරගෙන සිටී. අක්කර 9 කට වඩා වැඩි භූමි භාගයක් දැනට යොවුන් සේනාංකය හා සමෘද්ධි බැංකුව විසින් ආයතනයට කිසිදු බදු මුදලක් නොගෙවා භාවිතා කරනු ලැබේ. සමාගමට අයත් සමහර ඉඩම් කොටස් වල දැනට බලහත්කාරයෙන් නීතිවිරෝධී ලෙස නිවාස තනාගෙන සිටී.

## සේවක සුභසාධනය හා ගැටළු

සේවා සේවක සහභාගිත්ව කළමනාකරණය තුලින් සේවක අභිප්‍රේරණය හා සම්පත් වල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. අවධානම් ස්වභාවය හා සේවා පරිසර තත්වය හේතුවෙන් මිහිතුල සේවකයින්ගේ චර්යාවන්, මිහිපිට සේවකයින් හා බලන කල්හි වෙනසක් දක්නට ලැබේ.

සේවකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් නිසි වේලාවට ආරක්ෂණ උපකරණ හා ආරක්ෂණ ඇඳුම් සපයා ඇත. සේවකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට පිණිස එසවීමේ පද්ධතිය ද ඇතුලත්ව මිහිතුල උපකරණ සියල්ල නිසි පරිදි නඩත්තු කරනු ලැබේ. රිදීගම රෝහලෙන් රජයේ වෛද්‍යවරයෙක් සතියකට වරක් පතලට පැමිණ සියලුම සේවකයන් ඇතුළුව ඔවුන්ගේ දරු පවුල් වලද සෞඛ්‍ය තත්වය පරීක්ෂා කරනු ලැබේ. මූලික වෛද්‍ය උපකරණ හා හදිසි ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ වර්ග භාවිතා කරමින් පලපුරුදු පිරිමි හෙද සේවකයෙකු විසින් අපගේ වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලැබේ.

අබලන් තත්වයේ තිබූ දොඩම්ගස්ලන්ද ප්‍රධාන මාර්ගයේ සිට කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් වෙත පැමිනෙන මාර්ගය සේවකයන්ගේ, වාහන වල හා කළමනාකරණයේ ගමනාගමන පහසුව තකා පිලිසකර කරන ලදි.

කහටගහ සේවකයන් හඳුනාගැනීමේ පහසුවට සහ නිල ඇඳුමක අවශ්‍යතාවය මත කහටගහ ග්‍රැෆයිට් ලාංඡනය සහිත නිල ඇඳුම් කට්ටල දෙකක් (02) ක් සියලු සේවකයන්ට සපයා ඇත.

සේවකයින්ගේ රැකියා සුරක්ෂාව තහවුරු කිරීම පිණිස දැනට ස්ථිරත්වය හා ස්ථිර පිරිස් සැලැස්මක් අනුමතකර ගැනීමට කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලීම පිණිස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හරහා ලිපි ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් ආයතනයේ සියලු සේවකයින්ගේ, විශේෂයෙන් මිහිතුල සේවකයින්ගේ බැඳීම හා කැපවීම නොමැති වූයේ නම් සමාලෝචිත වර්ෂය තුල කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම ලබාගත් සාර්ථකත්වය පහසු දෙයක් නොවනු ඇත. නිතරම අනතුරු වලට නිරාවරණය වූ මිහිතුල කම්කරුවන්ගේ මෙම දායකත්වය සැමවිටම සිහිතබාගත යුතු මෙන්ම අගයකල යුතුවේ.

සමාලෝචිත වර්ෂය තුලදී මෙම සාර්ථකත්වය ලබාගැනීමට සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ද ඔවුන්ගේ නොමද දායකත්වය සහ සහයෝගය අඛණ්ඩව ලබාදුනි.

ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමා මෙම තනතුර මා වෙත ප්‍රදානය කිරීම වෙනුවෙන් මෙම අවස්ථාවේදී ස්තුති නොකලහොත් මා මෙම කාර්යය තුල අසාර්ථක වනු ඇත. ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමාටද, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙහි ගරු ලේකම්තුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයටද, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇතුළු කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම වෙත සහයෝගය ලබාදුන් සියලු කාර්ය මණ්ඩලයටද, විශේෂයෙන් කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ආයතනයේ සියළුම සේවකයන්ටද මා මේ අවස්ථාවේ අතිශයින් ස්තුතිවන්ත වෙමි. අවසාන වශයෙන් අප සමාගම වෙනුවෙන් මෙම වසරේදී ද කිසිම පැකිලීමකින් තොරව සමාගමේ විගණකවරු වශයෙන් තම විගණන කටයුතු නොපිරිහෙලා තෘප්තිමත් ලෙස ඉටු කල විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණකාධිපතිවරයාට සහ රණවීර නාගසිංහ සහ සමාගමේ වරලත් ගණකාධිකාරීවරුන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

අල්. හාජ්. එම්. අබ්දුල් මජීඩ්

සභාපති

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

2017 මාර්තු මස 10 වැනිදා

# විගණන කමිටු වාර්තාව

## විගණන කමිටු කාර්ය භාර්ය

විගණන කමිටුවේ මූලික අරමුණ වන්නේ මූල්‍ය වාර්තාකරණයේ ඉහල ප්‍රමිතිය හා ගුණත්වය, අවධානම් කළමනාකරණය, ව්‍යවස්ථාපිත හා නීත්‍යානුකූල අවශ්‍යතාවයන්ට අනුකූල වීම, දිරිගැන්වීම හා ආරක්ෂා කිරීම, ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම වේ.

## විගණන කමිටු සංයුතිය

විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තුන් දෙනෙකුගෙන් සමන්විත වන අතර මහා භාණ්ඩාගාරය විසින් නම් කරනු ලබන එක් විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් එහි සභාපති වශයෙන් කටයුතු කරයි. සමාගම් ලේකම්වරු කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ. විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| එන්. පී. ඒ. ආර්. ජයවර්ධන මහත්මිය | - | සභාපති |
| අයි. එම්. ජුනයිස් මහතා | - | අධ්‍යක්ෂ |
| බී. එස්. විමලසුන්දර මහතා | - | අධ්‍යක්ෂ |

## රැස්වීම් සහ පැමිණීම

කමිටුවේ රැස්වීම් කාර්තුවකට එක්වරක් කැඳවන අතර 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුල රැස්වීම් හතරක් (04) ක් පවත්වා ඇත. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් පත් කරන ලද කළමනාකාර මට්ටමේ නිලධාරීන් වශයෙන් ආතනයේ ගණකාධිකාරී හා අභ්‍යන්තර විගණක මෙම රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී මෙන්ම කැඳවීමක් කල අවස්ථාවකදී සහභාගී වේ.

## ක්‍රියාකාරකම්

කෙටුම්පත් අවසන් ගිණුම්, බාහිර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා ආදිය සමාලෝචනය හා සාකච්ඡා කිරීම විගණන කමිටුවේ කාර්යයභාරය වේ. මෙම වාර්තා විගණන කමිටුව විසින් විමර්ශනය කරන අතර නිර්දේශීත අතිරේක පාලන සහ අවදානම් අවම කිරීමේ උපක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් පවතින අභ්‍යන්තර පාලනය ශක්තිමත් කරන අතර වැරදි, වංචාවන් සහ සමාගම විසින් මුහුණ දෙන මූල්‍ය හා මෙහෙයුම් අවධානම් අවම කරීමට කටයුතු කරයි. මෙම සෑම කමිටු රැස්වීමකදීම අභ්‍යන්තර විගණන විමසුම් ගැඹුරින් සාකච්ඡා කරන අතර එහිදී ඉස්මතු වන ගැටලු අවමකර ගැනීම සඳහා කළමනාකරණයට උපදෙස් ලබාදීම සිදුවේ. මෙම සාකච්ඡා තුලින් මතුවන ඇතැම් කරුණු වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

අභ්‍යන්තර විගණක විසින් 2016/2017 සඳහා සත්‍ය හා සාධාරණ නිගමන ඉදිරිපත් කර ඇත්ද යන්න කමිටුව විසින් සොයා බැලේ.

කමිටුව වෙනුවෙන්

විගණන කමිටු සභාපති

## දැක්ම

"ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වාභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් ලොවට සපයන අනන්‍ය සැපයුම්කරු වීම."

## මෙහෙවර

"ස්වාභාවික මිනිරන් ඛණිජ සම්පත උපරිම ප්‍රයෝජනයට ගෙන, රටට විදේශ විනිමය උපයමින් හා සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී කොටස්කරුවෙකු වීම."

## අරමුණු

"මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි එකතු අගය උපරිම කිරීම. "

# සංවිධාන ව්‍යුහය

විධායක සභාපතිවරයකු සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම සංවිධානය වී තිබේ.

සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ සංවිධානය කර තිබේ.

- ✓ කැණීම
- ✓ සැකසුම්
- ✓ යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරු ශිල්පය
- ✓ අලෙවිකරණය
- ✓ පිරිස් අංශය
- ✓ පරිපාලනය
- ✓ මූල්‍ය කටයුතු සහ ගිණුම්කරණය
- ✓ සැපයීම් සහ ගබඩා අංශය
- ✓ සාමාන්‍ය සිවිල් ඉංජිනේරු අංශය
- ✓ ආරක්ෂක අංශය

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## 2017 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමඟ ඉදිරිපත් කරනු ලැබේ. එහි අඩංගු මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කොට ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

විගණකවරුන්ගේ වාර්තාව සමඟ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2017 ජූලි 31 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමතකර ඇත.

### ප්‍රධාන කාර්යයන්

සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

1. 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය මඟින් පිහිටුවන ලද රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ පතල් ප්‍රදේශයේ නම් කර ඇති ව්‍යාපාරය පවත්වාගෙන යාම.

2. එකී රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ වශයෙන් නම් කර ඇති එම පාර්ශවයට අයත් කරගත් සහ පාර්ශවය විසින් පරිහරණය කරන ලද චංචල සහ නිශ්චල දේපල වල හිමිකම පවත්වාගැනීම.

### මෙහෙයුම් හා මූල්‍යමය උද්‍යතයන් සමාලෝචනය

මෙම වාර්ෂික වාර්තාවේ, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ලාභ අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ව ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය සහ ගිණුම් සඳහා සටහන් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනයන් පිළිවෙලින් පිටු අංක 3 සිට 24 දක්වා ඇතුලත් වේ.

### මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහ විගණකවරුන්ගේ ස්වකීය වගකීම

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳෙන අතර, එබැවින් ඔවුන් සමාගමේ ගනුදෙනු වල ස්වභාවය සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2007 ක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත සහ කොළඹ කොටස් වෙළඳපලේ කොන්දේසි වලට අනුකූලව සකස්කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය නිගමනය කරනු ලබයි.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගම අවසන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී හා ඒවා භාවිතයේදී ගිණුම්රණ ප්‍රතිපත්ති යොදාගන්නා අතර වර්ෂය තුල ශ්‍රී ලංකා ගිණුම්රණ ප්‍රමිතීන්ගේ ඇති කරන ලද වෙනස්කම් වාර්ෂික වාර්තාවේ පිටු අංක 08 න් අනාවරණය කර ඇත.

## දේපල, පිරියත සහ උපකරණ

එක් එක් වර්ෂය තුල දේපල, පිරියත සහ උපකරණ වල සංචලනයන් මූල්‍ය ප්‍රකාශන වල 20 වන සටහනෙන් දැක්වේ.

## ආයෝජන

සමාගම රුපියල් 2,932,674.31 ක මුදලක් සේවකයින්ගේ පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා ජාතික ඉතිරිකිරිමේ බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක ආයෝජනය කර ඇත.

## පරිත්‍යාග

ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුල, සමාගම විසින් පරිත්‍යාගයන් සිදු කර නොමැත.

## විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරයාගේ වාර්තාව, වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ විශ්‍රාමය

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 හා 93 හි විධිවිධාන අනුව නැවත පත්වීමේ පදනම මත **මොහමඩ් ෂරීෆ් ලියාකත් අලිකාන් මහතා, බාලසූරිය මුදියන්සේලාගේ නන්ද විපුල බණ්ඩාර බාලසූරිය මහතා සහ උතුමන්කන්ඩු මුහමඩ් නිසාර් මහතා** විශ්‍රාම ගන්නා අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික අනුමැතිය මත ඔවුන් නැවත අධ්‍යක්ෂවරුන් වශයෙන් තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 210 හා 211 වගන්තීන් ප්‍රකාරව වයස අවුරුදු 70 ඉක්මවූ අල්. හාජ්. මීරාසාහිබු අබ්දුල් මජීඩ් මහතා විශ්‍රාම ගන්නා අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික අනුමැතිය මත ඔහු නැවත අධ්‍යක්ෂවරයෙකු වශයෙන් තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

## 2017 මාර්තු 31 දිනට අධ්‍යක්ෂවරු

2017 මාර්තු 31 දිනට තනතුරු හොබවන ලද අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වෙන පරිදි වේ.

**සම්පූර්ණ නම**

අල්. හාජ්. මීරාසාහිබු අබ්දුල් මජීඩ් මහතා

ඉස්මයිල් මොහමඩ් ජුනයිස් මහතා

මොහමඩ් ෂරීෆ් ලියාකත් අලිකාන් මහතා

නයිනානායක පතිරන්නැහැලාගේ අනූජා රෝෂිණී ජයවර්ධන මහත්මිය

බන්දුල සේනාධි විමලසුන්දර මහතා

උතුමන්කන්ඩු මුහමඩ් නිසාර් මහතා

බාලසූරිය මුදියන්සේලාගේ නන්ද විපුල බණ්ඩාර බාලසූරිය මහතා

## අධ්‍යක්ෂ මණ්ඩලය පහත ප්‍රකාශයන් සිදුකරනු ලැබේ.

1. සමාගම නීති සහ නියමයන් උල්ලංඝණය වන කිසිදු ක්‍රියාකාරකමක නොයෙදුන බව
2. සමාගම සම්බන්ධ වන කොන්ත්‍රාත් වල සියලු ද්‍රව්‍යමය අවශ්‍යතා ද්‍රව්‍යමය වශයෙන් උනන්දුවක් දැක්වූ කාරණා සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකෙන බව;
3. කොටස්කරුවන්ට අපක්ෂපාතී ලෙස සලකන බව සහතික කිරීමට සමාගම සියලු උත්සාහයන් ගන්නා බව
4. අවශ්‍ය විටදී ව්‍යාපාරය උපකල්පන හෝ සුදුසුකම් මත පදනම්ව, අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කරමින්, මූල්‍ය,මෙහෙයුම් හා අනුකූලතා පාලනයන් සමඟ අවධානම් කළමනාකරණය කරමින්, ව්‍යාපාරය කරගෙන යන අතර ඒවායේ සාර්ථකත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාගෙන ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශනවල 13 වැනි සටහනෙහි දක්වා තිබේ.

## සමාගමේ කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධය

සමාගමේ කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතාව මූල්‍ය ප්‍රකාශනවල සටහන් ක 06 න් හෙළිදරව් කර ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| අල් හාජ් එම් ඒ මජීඩ් මහතා | 8/8 |
| එම් එස් එල් අලිකාන් මහතා | 7/8 |
| එන් පී ඒ ආර් ජයවර්ධන මහත්මිය | 8/8 |
| අයි එම් ජුනයිස් මහතා | 6/8 |
| බී එස් විමලසුන්දර මහතා | 8/8 |
| මහාචාර්ය එන් ඩබ් බී බාලසූරිය මහතා<br>2016/06/29 වන දින පත්කර ඇත. | 6/6 |
| යූ එම් නිසාර් මහතා<br>2016/06/29 වන දින පත්කර ඇත. | 5/6 |

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය අනුව, රජයට සහ සේවකයන්ට අදාල සියලු ව්‍යවස්ථාපිත ගෙවීම්, අද දින වන විට නිරවුල් කොට තිබිම හෝ සමාගමේ පොත් වලට ගෙන තිබීම පිළිබඳව අධ්‍යක්ෂවරු තෘප්තිමත්ය.

## අසම්භාව්‍ය බැරකම් සහ ප්‍රාග්ධන බැදීම්

2017 මාර්තු 31 දිනට ප්‍රාග්ධන වියදම් ගිණුම මත සිදුකල අසම්භාව්‍ය බැරකම් සහ ප්‍රාග්ධන බැදීම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 08 න් දක්වා ඇත.

## ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සිදුවූ වැදගත් සිදුවීම් සලකා බැලූ අතර අවශ්‍ය විටදී, යෝග්‍ය ගැලපීම් සහ හෙලිදරව් කිරීම් කර ඇත.

## ශේෂ පත්‍රයට පසු සිදුවීම්

විශේෂයෙන් ගැලපීමට තරම් වූ බලපෑමක් ඇති කරන කිසිඳු සිදුවීමක් ශේෂ පත්‍ර දිනෙන් පසු ආයතනයේ සිදු වී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු ඉදිරියට කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ආයතනය සතුව පවතින බවට අධ්‍යක්ෂවරුන් විශ්වාස කරයි. එමනිසා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ පදනම යොදාගැනීම සුදුසු බව අධ්‍යක්ෂවරුන් සලකනු ලබයි.

## අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 08 න් දක්වා ඇත.

## විගණකවරු

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ විගණක වශයෙන් විගණකාධිපති දෙර්තමේන්තුව කටයුතු කලේය. මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01 ට අනුව අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගමේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සහය මෙහිදී ලැබුනි. මෙම විගණකවරුන් සම්බන්ධයෙන් කුමන අයුරකින් හෝ ඇල්මක් හෝ වෙනත් සබඳතාවයක් ඔහුට නොමැති බවත්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නීති හා ප්‍රතිපත්තීන්ට අනුකූලව ඔවුන් ස්වාධීනව කටයුතු කල බවත් විගණකාධිපතිවරයා විසින් තහවුරුකර ඇත.

මූල්‍ය වර්ෂය සඳහා, විගණකවරුන්ට ගෙවිය යුතු ගාස්තු, මූල්‍ය ප්‍රකාශන වල 14 වැනි සටහනේ දක්වා ඇත.

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01 ට අනුව ඉදිරි මූල්‍ය වර්ෂයේදී විගණකාධිපතිට සහයවීම සඳහා අර්නස්ට් ඇන්ඩ් යන්ග්, වරලත් ගණකාධිකාරීවරුන් පත් කිරීමට නියමිත අතර, ඔවුන් පත් කිරීමේ තීරණය හා ගෙවන ගාස්තුව ස්ථිර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරීමේ යෝජනාව වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතය.

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි අත්සන් තබන ලදී.**



**අධ්‍යක්ෂ** **අධ්‍යක්ෂ** **ලේකම්වරු**
**එකවුන්ට්ං සිස්ටම්ස් සෙක්රිටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

# විශේෂ ගිණුම්කරණ තොරතුරු

### නිෂ්පාදනය

| වර්ෂය | මෙට්‍රික් ටොන් |
|---|---|
| 2008/9 | 877 |
| 2009/10 | 915 |
| 2010/11 | 771 |
| 2011/12 | 888 |
| 2012/13 | 1018 |
| 2013/14 | 848 |
| 2014/15 | 712 |
| 2015/16 | 771 |
| 2016/17 | 811 |




### විකුණුම්

| වර්ෂය | මෙට්‍රික් ටොන් |
|---|---|
| 2008/9 | 497 |
| 2009/10 | 295.2 |
| 2010/11 | 760.3 |
| 2011/12 | 850.3 |
| 2012/13 | 537.8 |
| 2013/14 | 793 |
| 2014/15 | 708.5 |
| 2015/16 | 558.6 |
| 2016/17 | 530 |




### ආදායම

| වර්ෂය | රු. මිලියන |
|---|---|
| 2008/9 | 60.4 |
| 2009/10 | 21.1 |
| 2010/11 | 105 |
| 2011/12 | 128 |
| 2012/13 | 91.6 |
| 2013/14 | 143.6 |
| 2014/15 | 122.5 |
| 2015/16 | 109 |
| 2016/17 | 112.4 |




### දළ ලාභය

| වර්ෂය | රු. මිලියන |
|---|---|
| 2008/9 | 44.8 |
| 2009/10 | 13.1 |
| 2010/11 | 62.4 |
| 2011/12 | 74.9 |
| 2012/13 | 53.5 |
| 2013/14 | 91.36 |
| 2014/15 | 56.35 |
| 2015/16 | 44.08 |
| 2016/17 | 45.47 |




### බදුපෙර ශුද්ධ ලාභය

| වර්ෂය | රු. මිලියන |
|---|---|
| 2008/9 | 37.3 |
| 2009/10 | 1.5 |
| 2010/11 | 37.7 |
| 2011/12 | 54.3 |
| 2012/13 | 16.4 |
| 2013/14 | 21.18 |
| 2014/15 | -10.84 |
| 2015/16 | 2.39 |
| 2016/17 | -2.52 |




### ශුද්ධ වත්කම්

| වර්ෂය | රු. මිලියන |
|---|---|
| 2008/9 | 4.4 |
| 2009/10 | 137 |
| 2010/11 | 166 |
| 2011/12 | 214 |
| 2012/13 | 423.4 |
| 2013/14 | 367.5 |
| 2014/15 | 337 |
| 2015/16 | 336 |
| 2016/17 | 334 |



# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## වාර්ෂික ගිණුම්
## 2016/2017

**2016 අප්‍රේල් 01 සිට 2017 මාර්තු 31 දක්වා**

**අර්නස්ට් ඇන්ඩ් යන්ග්**
**වරලත් ගණකාධිකාරීවරුන්**

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
# ගිණුම් 2016/17

| **අන්තර්ගතය** | **පිටුව** |
|---|---|
| ආයතනික තොරතුරු | **1** |
| විගණකවරුන්ගේ වාර්තාව | **2 - 3** |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | **4** |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | **5** |
| ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | **6** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **7** |
| වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් | **8 - 14** |
| මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම | **15** |
| ගිණුම් සඳහා සටහන් | **16 - 22** |
| ආදායම් බදු ගණනය කිරීම | **23 - 24** |

# <u>කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්</u>

## 2017 මාර්තු 31 දිනට ආයතනික තොරතුරු

**සමාගමේ නම**
කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**නෛතික ස්වභාවය**
මුදල් අමාත්‍යාංශය යටතේ ඇති සීමිත වගකීම් සහිත පොදු සමාගමකි.

**කොටස් හිමිකම සහ අයිතිය**
ශ්‍රී ලංකා රජය වෙනුවෙන් 100% ක් මහා භාණ්ඩාගාර ලේකම්ට හිමිවේ.

**ලියාපදිංචි කාර්යාලය (ප්‍රධාන කාර්යාලය)**
නො. 561/3, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

**පතල් කාර්යාලය**
කහටගහ පතල්, මදුරාගොඩ, දොඩම්ගස්ලන්ද.

**සබැඳි**

<u>ප්‍රධාන කාර්යාලය</u>

| | | |
|---|---|---|
| දුරකථන | : | 011- 2368738 |
| ෆැක්ස් | : | 011- 2058062 |
| ඊ මේල් | : | kgll@sltnet.lk |
| වෙබ් අඩවිය | : | www.kgraphite.lk |

<u>පතල් කාර්යාලය</u>

| | | |
|---|---|---|
| දුරකථන | : | 037-2252015 |
| ෆැක්ස් | : | 037-4931711 |

**ව්‍යවස්ථාපිත තත්වය**
2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමිත වගකීම් සහිත පොදු සමාගමකි.

**සමාගම් ලියාපදිංචි අංකය**
පී.බී. **1513**

**2017 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය**
අල් හාජ් මීරාසහිබු අබ්දුල් මජීඩ්
ඉස්මයිල් මොහමඩ් ජුනයිස්
මොහමඩ් ෂරීෆ් ලියාකත් අලිකාන්
නයිනායක පතිරන්නැහැලාගේ අනූජා රෝෂණී ජයවර්ධන
බන්දුල සේනාධි විමලසුන්දර
උතුමන්කන්ඩු මුහමඩ් නිසාර්
බාලසූරිය මුදියන්සේලාගේ නන්ද විපුල බණ්ඩාර බාලසූරිය

**ලේකම්වරු**
එකවුන්ටිං සිස්ටම්ස් ඇන්ඩ් සෙක්රිටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
නො. 02, කාසල් වීදිය, කොළඹ 04.

**විගණකවරු**
**ශ්‍රී ලංකා විගණකාධිපති**
**සහායකයින්**
අර්නස්ට් ඇන්ඩ් යන්ග්
වරලත් ගණකාධිකාරීවරුන්
නො.201, ද සේරම් පෙදෙස
කොළඹ 10.

**බැංකුකරු**
ලංකා බැංකුව, කොල්ලුපිටිය සහ රිදීගම ශාඛා

## ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

### කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගමේ සාමාජිකයින් වෙත

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව**

මේ සමඟ ඇති කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගමෙහි 2017 මාර්තු 31 දිනට වූ මූල්‍ය තත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය හා වෙනත් පැහැදිලි කිරීමේ සටහන් (පිටු අංක 08 සිට 24 දක්වා ඇති) වලින් යුක්ත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා අපක්ෂපාතී අදහසක් ලබාදෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එසේම වැරදි හෝ වංචා නිසා සිදුවන ප්‍රමාණාත්මක වැරදි වලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යැයි නිර්ණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාමද ඇතුලත් වේ.

**විගණකවරුන්ගේ වගකීම**

අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව අපගේ විගණනය සිදු කලෙමු. එම ප්‍රමිතීන්ගේ නියමය පරිදි මූල්‍ය ප්‍රකාශන එහි ආචාර ධර්ම පද්ධතීන් වලට අනුකූල බවට හා සාවද්‍ය තොරතුරු වලින් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සඳහා අපගේ විගණනය සැලසුම් කිරීම අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන වල ගණනය කිරීම් හා හෙලිදරව් කිරීම් වල විගණන සාක්ෂි ලබාගැනීම සඳහා වන ක්‍රියාපටිපාටීන් ඉටුකිරීමට විගණනය දායක වේ. සාවද්‍ය තොරතුරු වලින් හෝ වැරදි හා වංචා වලින් මූල්‍ය ප්‍රකාශන වලට සිදුවන හානි ඇගයීම ද ඇතුලත්ව තෝරාගත් ක්‍රියාපටිපාටීන් විගණකගේ විනිශ්චය මත රඳා පවතී. විගණක විසින් මෙම හානිදායක තත්වයන් ඇගයීම සිදු කරනුයේ ආයතනයට අදාල සම්පූර්ණ අන්තර් පාලනයන්ගේ කාර්යක්ෂමතාවය පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමේ අරමුණකින් නොවන අතර හුදෙක්ම මෙහිදී විගණන ක්‍රියාපටිපාටිය පිළියෙල කිරීමේ කාර්යයේදී අවස්ථානුකූලව සත්‍ය හා අපක්ෂපාතී අදහසක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන වල නිසි පිළියෙල කිරීම් සහ නිසි ඉදිරිපත් කිරීම් වලට අදාල අභ්‍යන්තර පාලනය පිළිබඳ සැලකිලිමත් වේ. තවද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරමින් යුක්තිසහගත ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කරනවාද යන්නත් එලෙසම මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කරනවාද යන්නත් ඇගයීම විගණනයකට ඇතුලත් වේ.

අප විසින් ලබාගත් විගණන සාක්ෂි අපගේ විගණන මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා යෝග්‍ය බව අප විශ්වාස කරමු.

**මතය**

අපගේ මතය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2017 මාර්තු 31 දිනෙන් අවසන්, සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන තුලින් එහි මූල්‍ය තත්වයෙහි, මූල්‍යමය ක්‍රියාකාරිත්වයෙහි සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දේ.

**වෙනත් නීත්‍යානුකූල අවශ්‍යතාවයන් වාර්තා කිරීම.**

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති අංක 163 (2) හි අවශ්‍යතාවයන්ට අනුකූලව අප පහත කරුණු ගෙනහැර දක්වන්නෙමු.

අ). විගණන මතයෙහි පදනම, විෂයපථය සහ සීමාවන් ඉහත ගෙන හැර දැක්වූ පරිදි වේ.

. 02 අපගේ අදහස:

- අප විසින් විගණනයට අවශ්‍ය සියලු තොරතුරු සහ විස්තර ලබාගත් අතර, අපගේ විමර්ෂණයෙන් පෙනීගිය පරිදි සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

- සමාගමෙහි මූල්‍ය වාර්තා, සමාගම් පනතෙහි වගන්ති අංක 151 හි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2017 ඔක්තොම්බර් 24
කොළඹ

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2017<br>රුපියල් | 2016<br>රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මිනිරන් විකුණුම් | 10 | 112,413,523.45 | 109,011,825.22 |
| සෘජු පිරිවැය, කැණීම් පිරිවැය | 11 | (66,934,529.41) | (64,922,011.97) |
| **දළ ලාභය/අලාභය** | | **45,478,994.04** | **44,089,813.25** |
| වෙනත් ආදායම් | 12 | 2,459,435.10 | 890,704.12 |
| **අඩුකලා: මෙහෙයුම් පිරිවැය** | | | |
| කාර්යය මණ්ඩල පිරිවැය | 13 | (24,895,764.82) | (23,931,547.49) |
| ආයතන හා පරිපාලන පිරිවැය | 14 | (6,766,436.06) | (6,004,159.56) |
| නඩත්තු පිරිවැය | 15 | (440,845.78) | (293,196.28) |
| උපයෝගී පිරිවැය | 16 | (544,113.79) | (409,269.97) |
| ක්ෂය පිරිවැය | 17 | (6,482,396.87) | (6,870,398.57) |
| විදේශ විනිමය ලාභ / අලාභ | | (2,396,026.32) | (1,754,133.05) |
| නිශ්චිත දායකත්ව සැලැස්ම - පාරිතෝෂික | | (2,597,235.15) | (1,661,340.55) |
| පරිපාලන පිරිවැය | | (44,122,818.79) | (40,924,045.47) |
| විකිණීමේ හා බෙදාහැරීමේ පිරිවැය | 18 | (1,557,958.20) | (1,415,495.28) |
| වෙනත් වියදම් | 19 | (376,453.80) | (762,314.98) |
| **මෙහෙයුම් ලාභය / අලාභය** | | 1,881,198.35 | 644,534.41 |
| අඩුකිරීම් | | (4,403,238.91) | - |
| **බදු පෙර ලාභය / අලාභය** | | **(2,522,040.56)** | **644,534.41** |
| බදුකරණය | | (2,116,282.71) | (1,129,939.81) |
| විලම්භිත බදු වියදම් | | 3,219,378.32 | (833,519.13) |
| **බදු පසු ලාභය / අලාභය** | | **(1,418,944.95)** | **(1,318,924.53)** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් / වියදම්** | | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් / වියදම්** | | **(1,418,944.95)** | **(1,318,924.53)** |

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| මාර්තු 31 දිනට | සටහන් | 2017<br>රුපියල් | 2016<br>රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 20 | 212,504,874.73 | 234,840,672.36 |
| මෙහෙයුම් නොවන වත්කම් | 21 | 3,796,760.34 | 3,009,330.26 |
| පොල් වගාව සංවර්ධනය | | 1,694,235.36 | 1,694,235.36 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම | | 2,932,674.31 | 2,000,000.00 |
| | | **220,928,544.74** | **241,544,237.98** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 22 | 125,652,065.79 | 100,299,108.05 |
| ණයගැතියෝ, තැන්පතු සහ ලැබියයුතු දෑ | 23 | 15,871,697.21 | 18,595,391.01 |
| මුදල් හා මුදල් සමාන දෑ | 24 | 7,733,161.29 | 7,404,947.31 |
| | | **149,256,924.29** | **126,299,446.37** |
| **මුළු වත්කම්** | | **370,185,469.03** | **367,843,684.35** |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 25 | 13,000,000.00 | 13,000,000.00 |
| රඳවාගත් ඉපැයීම් | | 321,103,302.54 | 322,526,747.68 |
| | | **334,103,302.54** | **335,526,747.68** |
| **දිගුකාලීන බැරකම්** | | | |
| විලම්භිත බදු බැරකම් | 26 | 311,272.90 | 3,530,651.22 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 27 | 10,510,916.20 | 8,762,764.00 |
| | | **10,822,189.10** | **12,293,415.22** |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ | 28 | 2,622,730.04 | 1,978,804.21 |
| බදු සඳහා ප්‍රතිපාදන | 29 | 7,029,236.06 | 6,412,953.35 |
| උපචිත වියදම් | 30 | 15,608,011.29 | 11,631,763.89 |
| | | **25,259,977.39** | **20,023,521.45** |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **370,185,469.03** | **367,843,684.35** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි පිළියෙල කර ඇති බව මම සහතික කරමි.

ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වන අතර අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

සභාපති

අධ්‍යක්ෂ

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | කොටස් ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත ලාභය /(අලාභය) | එකතුව |
|---|---|---|---|---|
| | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් |
| 2015 අප්‍රේල් 01 දිනට ශේෂය | 13,000,000.00 | 250,220,462.70 | 73,750,228.61 | 336,970,691.31 |
| රඳවාගත් ඉපැයීම් වලට මාරු කිරීම් | - | (250,220,462.70) | 250,220,462.70 | - |
| පෙර වර්ෂයේ ගැලපුම් | - | - | (125,019.10) | (125,019.10) |
| වර්ෂය සඳහා ලාභය / (අලාභය) | - | - | (1,318,924.53) | (1,318,924.53) |
| 2016 මාර්තු 31 දිනට ශේෂය | **13,000,000.00** | **-** | **322,526,747.68** | **335,526,747.68** |
| 2016 අප්‍රේල් 01 දිනට ශේෂය | 13,000,000.00 | - | 322,522,247.49 | 335,522,247.49 |
| වර්ෂය සඳහා ලාභය / (අලාභය) | - | - | (1,418,944.95) | (1,418,944.95) |
| 2017 මාර්තු 31 දිනට ශේෂය | **13,000,000.00** | **-** | **321,103,302.54** | **334,103,302.54** |

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | 2017 | 2016 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ/(භාවිතා කිරීමෙන්)** | | |
| ආදායම් බදු වියදම් වලට පෙර ශුද්ධ ලාභය | (126,014) | 2,398,667 |
| **ගැලපීම් :** | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 2,597,235 | 1,661,341 |
| කල්බදු පොලිය | - | 39,696 |
| පෙර වර්ෂය සඳහා ගැලපීම | (4,500) | 230,250 |
| ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මත ක්ෂය | 21,504,785 | 21,769,679 |
| මෙහෙයුම් නොවන වත්කම් ඉවත් කිරීම | 4,403,239 | - |
| විදේශ විනිමය අලාභ | (2,396,026) | (1,754,133) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **25,978,719** | **24,345,500** |
| තොග (වැඩිවීම්)/ අඩුවීම් | (25,039,215) | (15,960,308) |
| ලැබිය යුතු දෑ (වැඩිවීම්)/අඩුවීම් | 2,723,694 | (6,343,090) |
| ණයහිමියන්ගේ (වැඩිවීම්)/අඩුවීම් | 643,926 | 1,478,527 |
| උපචිත වියදම් (වැඩිවීම්)/අඩුවීම් | 3,976,247 | 1,725,929 |
| **මෙහෙයුම් කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **8,283,370** | **5,246,557** |
| **ආයෝජන කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද මුදල් ප්‍රවාහ** | | |
| ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මිලට ගැනීම | (4,673,399) | (665,780) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන | (932,674) | 5,000,000 |
| **ආයෝජන කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්)ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(5,606,073)** | **4,334,220** |
| **මූල්‍ය කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද මුදල් ප්‍රවාහ** | | |
| ආදායම් බදු ගෙවීම් | (1,500,000) | (3,006,310) |
| පාරිතෝෂික ගෙවීම් | (849,083) | (148,288) |
| කල්බදු ගෙවීම් | - | (2,315,936) |
| **මූල්‍ය කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(2,349,083)** | **(5,470,534)** |
| **මුදල් හා මුදල් සමාන දේවල් වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | 328,214 | 4,110,243 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | 7,404,947 | 3,294,704 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දේ** | **7,733,161** | **7,404,947** |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව - රිදීගම | 767,813 | 59,547 |
| ලංකා බැංකුව - කොල්ලුපිටිය | 25,358 | 1,349,312 |
| වාසික විදේශ ව්‍යවහාර ඩොලර් ගිණුම - ලංකා බැංකුව, කොල්ලුපිටිය | 6,890,560 | 5,961,366 |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 27,716 | 12,358 |
| සුළු මුදල් - පතල් කාර්යාලය | 21,714 | 22,365 |
| | **7,733,161** | **7,404,947** |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් යනු, 1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසායන් පුනරුත්ථාපනය කිරීමේ පනත යටතේ වර්ෂ 1997 දී රජයට නැවත පවරනු ලැබුවාවූද, මීට ඉහතදී 'ජනතාකරණය' කර තිබුණාවූද සමාගමකි. දැනට එය සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යාපාරයක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතියි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 561/3, ඇල්විටිගල මාවත නාරාහේන්පිට, කොළඹ 05. හි පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන කාර්යයන් සහ කාර්යයන් වල ස්වභාවය

කාලපරිච්ජේදය තුල මිනිරන් නිෂ්පාදනය සහ අපනයනය කිරීම සමාගමේ ප්‍රධාන කාර්යය විය.

### 1.3 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම වේ.

### 1.4 සංසන්දනාත්මක සටහන්

පෙර වර්ෂයන්ගේ පැවති සටහන් හා වාක්‍යයන් ප්‍රවර්තන වර්ෂයට අනුකූල වන පරිදි නැවත සකස්කොට ඉදිරිපත්කර ඇත.

## 2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 2.1 පිළියෙල කිරීමේ පදනම

විශේෂයෙන් දක්වා ඇති දැ හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. විශේෂයෙන් දක්වා ඇති දැ හැර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කර ඇත.

### 2.2 අනුකූලතා ප්‍රකාශනය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වන එස්.එල්.එෆ්.ආර්.එස්. (SLFRS) හා එල්.කේ.ඒ.එස්. (LKAS) (මින් ඉදිරියට එස්.එම්.ඊ. (SME) සඳහා එස්.එල්.එෆ්.ආර්.එස්. (SLFRS) ලෙස දක්වනු ලැබේ.) අනුව පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන, පසුගිය එක් වර්ෂයකට (2016 ට) පමණක් අදාලව සංසන්දනාත්මක තොරතුරු ඇතුලත්කර ඇත. මෙම සංක්‍රාන්තියේදී ආයතනය විසින් සාධාරණ අගය හෝ ප්‍රත්‍යාගණිත අගය, කල්පිත පිරිවැයක් ලෙස ඇතුලත් කිරීමක් හෝ කල්පිත පිරිවැයක් සේ ලියාහැරීමක් සිදුකර නොමැත. ආයතනය විසින් එහි ආරම්භක එස්.එල්.එෆ්.ආර්.එස්. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් බලපවත්නා තෙක් අඛණ්ඩව එම ප්‍රතිපත්තීන් අනුගමනය කරන අතර පෙර වර්ෂයන්හි ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ආශ්‍රයෙන් 2016 අප්‍රේල් 01දින සිට මූල්‍ය තත්වය ඉදිරිපත් කරනු ලැබේ.

### 2.3 වැදගත් ගිණුම්කරණ තීරණයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්, සහ පවත්නා හෙළිදරව් කිරීම් සහ අසම්භව්‍ය බැරකම් වල හෙළිදරව් කිරීම් හි වාර්තාගත වටිනාකම් වලට බලපාන, තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සකස් කිරීම සඳහා කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. මෙම උපකල්පන වල සහ ඇස්තමේන්තු වල අස්ථිරභාවය අනාගතයේදී වත්කමක හෝ බැරකමක ධාරණ අගයෙහි වැදගත් වෙනස්වීමක් සඳහා බලපානු ඇත.

**තීරණයන්**
සමාගම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකරණය විසින්, මූල්‍ය වාර්තා තුලින් හදුනාගත හැකි, වටිනාකම් මත වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කරන පහත සඳහන් තීරණයන් ගෙන ඇත.

**අ.) දේපල වර්ගීකරණය**
ආයතනය විසින් දේපල ආයෝජන දේපලක් වශයෙන් වර්ග කරනවාද, නැතහොත් අයිතිකරු භුක්තිවිදින දේපලක් වශයෙන් වර්ග කරනවාද යන්න තීරණය කරනු ලැබේ. ඉඩම් හා ගොඩනැගිලි ඇතුලුව ආයෝජන දේපල ප්‍රමාණාත්මක වශයෙන් භාවිතා නොකලේනම් හෝ ආයතනයේ මෙහෙයුම් කටයුතු වලට භාවිතා නොකලේ නම් හෝ සාමාන්‍ය විකුණුම් කටයුතු සඳහා නොවන්නේ නමුත් මූලික වශයෙන් කුලී ආදායම් ඉපැයීමට හා ප්‍රාග්ධනය වර්ධනය කරගැනීමට ආයතනය විසින් දේපල ආයෝජන දේපලක් වශයෙන් වර්ගීකරණය කිරීමේදී, එම ආයෝජන දේපල අනෙකුත් වත්කම්වලින් ස්වාධීනව මුදල් ප්‍රවාහයන් උත්පාදනය කරන්නේද යන්න සලකා බලනු ලැබේ. අයිතිකරු පාරිභෝජනය කරන දේපල, දේපල වලට පමණක් නොව නිෂ්පාදන හෝ සැපයුම් කටයුතු වල භාවිතා කරන අනෙකුත් වත්කම් වලින්ද මුදල් ප්‍රවාහයන් උත්පාදනය වේ. සමහර වත්කම් ගොන්නක් වශයෙන් පවතින අතර ඒවා කුලී ආදායම් ඉපැයීම හෝ ප්‍රාග්ධන උත්පාදනය කර ගැනීමට පවත්වාගෙන යන අතර අනෙකුත් ගොනු භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීම හෝ පරිපාලන අරමුණු සඳහා පවත්වාගෙන යනු ලැබේ. මෙම වත්කම් ගොනු වෙන් වෙන් වශයෙන් විකිණීමට හැකිනම් (මූල්‍ය කල්බදු යටතේ බදු දීම) හෝ වෙනම මූල්‍ය ගිණුම් පිළියෙල කරනු ලැබේ. ගොනුව වෙන් වෙන් වශයෙන් විකිණීමට නොහැකි නම්, දේපල ආයෝජන දේපලක් වශයෙන් ප්‍රමාණාත්මක නොවන ගොනුවක් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීමට හෝ පරිපාලන අවශ්‍යතාවයන්ට යටත්ව ගිණුම්කරණය කරනු ලැබේ. අතිරේක සේවාවන් ඉතා වැදගත් ද යන්න දේපල ආයෝජන දේපලක් වශයෙන් සුදුසුද යන්න තීරණය කිරීමේදී වැදගත් වේ. ආයතනය තීරණ ගැනීමේදී එකිනෙක වත්කම් වෙන් වෙන් වශයෙන් සලකා බලනු ලැබේ.

**ආ.) ඇස්තමේන්තු සහ උපකල්පන**
ප්‍රධාන උපකල්පන අනාගතය තීරණය කරන අතර ඇස්තමේන්තු වල, මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම් වල ධාරණ අගයෙහි සැලකිය යුතු වෙනස්වීමකට හේතුවන, සැලකිය යුතු අවධානමක් ඇති, පහත විස්තර කර ඇති, අනෙකුත් ප්‍රධාන ප්‍රභවයන් වාර්තාකරන දිනයේදී නිමානය කිරීම අවිනිශ්චිත වේ. සමාගම එහි මූල්‍ය වාර්තා සකස් කිරීමේදී පරාමිතීන් මත පවතින උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කර ගනී. අනාගත සංවර්ධනය පිළිබඳ වාතාවරණයන් සහ උපකල්පනයන් කෙසේ වෙතත් වෙළඳපොල වෙනස්වීම් හෝ සමාගමේ පාලනය තුලින් පැන නගින සිද්ධීන් හේතුවෙන් වෙනස් විය හැක. උපකල්පනයන්හි එවැනි වෙනස්කම් මතුවන අවස්ථාවේදීම මහහරවා ගනු ලැබේ.

**ඇ.) බදුකරණය**
විලම්බිත බදු වත්කම් එහි සසම්භාවී ප්‍රමාණයෙන්ම අභාවිත බදු අලාභයන් ලෙස හඳුනාගත හැකි අතර එහි සසම්භාවී ප්‍රමාණයට එරෙහිව අලාභයන් උපයෝජනය කල හැකි දේවල් බදු අය කල හැකි ලාභය ලෙස පැවතිය හැක. විලම්භිත බදු වත්කම් අගය තීරණය කිරීම සඳහා වැදගත් කළමනාකරණ තීරණයන් අවශ්‍ය වන අතර ඒවා කාලානුරූපතාව සහ අනාගත බදු අයකල හැකි ලාභයන් සමග අනාගත බදු සැලසුම් උපායමාර්ගයන් මත පදනම්ව හඳුනාගත හැකි වේ.

**ඈ.) සේවක ප්‍රතිලාභ**
සමාගම විසින් එස්.එල්.එෆ්.ආර්.එස්. හි 28 වන ඒකකයෙන් එස්.එම්.ඊ. සඳහා නිර්දේශකර ඇති ප්‍රක්ශිප්ත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කරමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම වන පාරිතෝෂික මුදලින් පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභයන්ගේ වර්තමාන අගය මනිනු ලැබේ.

**ඉ.) මූල්‍ය නොවන වත්කම් හානිකරණය.**
ආයතනය වාර්තා කරන සෑම දිනයකම මූල්‍ය නොවන වත්කම් සඳහා යම් හානිකරණ තත්වයක් ඇත්ද යන්න තක්සේරු කරනු ලැබේ. ඉදිරියට ගෙනයන අගය නැවත අයකර ගත නොහැකි තත්වයක් පෙන්නුම් කරනවිට මූල්‍ය නොවන වත්කම් හානිකරණයන් සඳහා පරීක්ෂා කරනු ලැබේ.

**ඊ.) වෙළඳ හා අනෙකුත් ලැබියු යුතු දෑ හානිකරණය**
ආදායම් වාර්තා වල හානිකරණයන් වාර්තා කල යුතු ද යන්න තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් සියලු ලැබිය යුතු දෑ වාර්තා කරන සෑම දිනකම සමාලෝචනය කරනු ලැබේ. ගෙවිය යුතු වියදම් වල කාලසීමාව සහ කළමනාකරණය විසින් අවධානය යොමු කරන, නැවත අය කරගත නොහැකි භාවයක් පෙන්නුම් කරන වෙනත් සාධකයන් පිළිබඳව සලකා බලමින් එවැනි ලැබිය යුතු දෑ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකරණය විසින් තීරණයන් යොදා ගනී.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

**3.1 ආදායම හඳුනාගැනීම**

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති, ආදායම විශ්වාසයෙන් මැනිය හැකි, ගෙවීම් කරන තෙක් නොසලකා හරින, සසම්භාවී ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ගෙවීම් සහ බැහැර කල බදු හෝ තීරු බදු වල ගිණුම්කරණ ගිවිසුම්ගත නිශ්චිත කොන්දේසි වලට අනුකූලව ලැබුනු සහ ලැබිය හැකි දේවල් වල සාධාරණ අගයට ආදායම මනිනු ලැබේ. ආදායම හා වියදම ගැලපීමේදී උපචිත පදනම අනුගමනය කර ඇත.

**අ. අපනයන ආදායම**

අපනයන ආදායම සත්‍ය අපනයන මත පදනම්ව උපචිත පදනම මත හඳුනාගනී.

**ආ. පොලී ආදායම**

පොලී ආදායම ලද අවස්ථාවේදී ම ගිණුම්ගත කරනු ලැබේ.

**ඇ. වතුවගා ආදායම**

වතු ඵලදාවෙන් ලැබෙන ආදායම මුදල් පදනම මත හඳුනා ගැනේ.

**ඈ. වෙනත් ආදායම්**

වෙනත් ආදායම් සත්‍ය පිරිවැය පදනමට හඳුනාගැනේ.

**3.2 වියදම්**

වර්ෂය සඳහා ලාභ/ (අලාභ) ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දැරීමට සිදු වන සියළු වියදම්, උපචිත පදනම මත ආදායමෙන් අයකරගෙන ඇත.

**3.3 බදුකරණය**

**අ.) ප්‍රවර්තන බදු**

ප්‍රවර්තන ආදායම් බදු වත්කම් සහ බැරකම්, ප්‍රවර්තන වර්ෂයට සහ පෙර වර්ෂ වලට අදාලව බදු අධිකාරීත්වයට ගෙවූ හෝ යලි අයකර ගැනීමට අපේක්ෂා කරන අගයට හඳුනාගනී. වාර්තා කරන දිනය වන විට පනවන ලද හෝ ස්වාධීන ලෙස පනවනු ලැබූ වටිනාකම් ගණනය කිරීම සඳහා බදු අනුපාතයන් හා බදු නීතීන් යොදා ගනී.

**ආ.) විලම්භිත බදු**

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවය වෙනුවෙන් වාර්තා කරන දිනය වන විට, බදු පදනමට සකස් කෙරෙන වත්කම්, වගකීම් සහ ඒවායේ ධාරණ අගයන් තුල ඇති විලම්භිත බදු තාවකාලික වෙනස්කම් මත, වාර්තාකරන දිනයේ දී ඇතුලත් කරනු ලැබේ. සියලු බදු අයකල හැකි තාවකාලික වෙනස්වීම් විලම්භිත බදු බැදියාවන් ලෙස හඳුනාගැනේ. ඉදිරියට ගෙන ආ භාවිතා නොකල බදු ණය සහ වෙනත් භාවිතා නොකල බදු අලාභයන් වැනි සියලු අඩුකල හැකි තාවකාලික වෙනස්කම් විලම්භිත බදු වත්කම් ලෙස හඳුනා ගනී. අඩු කල හැකි තාවකාලික වෙනස්කම් වලට එරෙහිව පවතින, සසම්භාවී ප්‍රමාණයට හඳුනාගන්නා බදු අය කල හැකි ලාභය විලම්භිත බදු වත්කම් ලෙස හඳුනාගන්නා අතර ඉදිරියට ගෙන ආ, භාවිතා නොකල බදු ණය සහ භාවිතා නොකල බදු අලාභයන් උපයෝජනය කල හැකි වේ.

එක් එක් වාර්තා කරන දිනයන් වලදීම විලම්භිත බදු වත්කම්හි ධාරණ අගය සමාලෝචනය කර උපයෝජනය කිරීමට පවතින සියලුම විලම්භිත බදු වත්කම් හෝ විලම්භිත බදු වත්කම් වල කොටසක් ප්‍රමාණවත්, සසම්භාවී බදු අයකල හැකි ලාභයක් නොමැතිනම් එම ප්‍රමාණයෙන්ම අඩුකරනු ලැබේ.

